# පැරණි ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර වාණිජ්‍යකරණය
## (බදුලු ටැම් ලිපිය ඇසුරින් විමසුමක්)

ටැම්පිටියේ සිරිධම්ම හිමි

පුරාවිද්‍යා අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය. keselpothawimala@gmail.com

ප්‍රමුඛ පදඃ වාණිජ්‍යකරණය, බදුලු ටැම් ලිපිය, පැරණි ශ්‍රී ලංකාව

### හැඳින්වීම

මහියංගනය සිට කි.මී. 5 ක් පමණ ඊශාන දිශාව වන්නට හොරබොර වැව අසලින් හමු වූ බදුලු ටැම් ලිපිය IV වන උදය (ක්‍රි.ව. 946 - 954) රජුගේ කාලයට අයත් ලේඛණයකි. බදුල්ල දිස්ත්‍රික්කයේ උප ඒජන්ත ලෙස කටයුතු කළ ජොන් බෙලී 1857 දී පමණ ලිපිය සොයා ගැනීමට සමත් විය. උස අඩි 8 යි. අගල් 5 කින් හා පළල අඩි 10 1/2 කින් යුක්ත මෙම ලේඛනය කොටස් හතරකින් යුක්ත වේ. ශ්‍රී ලංකාවෙන් දැනට සොයා ගෙන ඇති ටැම් ලිපි අතරින් ප්‍රමාණයෙන් විශාල ලිපිය මෙය වන අතර කුඩා අක්ෂරවලින් යුක්ත ලේඛණ ලෙස ද පිළිගනී. (අමරවංශ හිමි 1969 : 224)

සෙල්ලිපිය පිළිබඳව අවධානය යොමු කිරීමේදී කරුණු කිහිපයක් නිසා වැදගත් වේ. ශ්‍රී ලංකාවේ පුරාණ ගමක ස්වරූපය, රාජ්‍ය සංවිධානය, අධිකරණ කටයුතු, සමාජ සිරිත්විරිත්, සාක්ෂරතාව මෙන්ම අභ්‍යන්තර වාණිජ කටයුතු ඒ අතර ප්‍රධාන වේ. මෙම ලිපියෙහි මුඛ්‍ය අරමුණ වන්නේ බදුලු ටැම්ලිපිය ඇසුරින් පැරණි ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක අභ්‍යන්තර වාණිජ්‍යකරණයේ ස්වරූපය සාකච්ඡා කිරීමයි. ඕනෑම සමාජයක දුරස්ථ මෙන්ම අභ්‍යන්තර වෙළඳාම සකස් වීමේදී දේශපාලනික, සමාජීක, සංස්කෘතික හා ආගමික පසුබිම හේතු වේ. සමාජ අවශ්‍යතාව, හා පීඩනය එක්ව ගොඩනැගුණු චින්තන ප්‍රවාහය නව නිෂ්පාදන හා තාක්ෂණය නිර්මාණය කරයි. එය බොහෝ විට අභ්‍යන්තර වාණිජකරණය සමඟ බද්ධ වෙමින් ජාතික ආර්ථිකය පෝෂණය කරයි.

බදුලු ටැම් ලිපිය අධ්‍යයනය කරන විට පෙනී යන කරුණ වන්නේ ශ්‍රී ලංකාවේ අතීතයේ විධිමත් වෙළඳ ක්‍රමයක් හා දියුණු වාණිජමය තත්ත්වයක් තිබුණු බවයි. එම වාණිජ කටයුතු වාර්තමානය වනවිට හාත්පසින් ම දියුණු හා වෙනස්කම්වලට ලක් වී තිබෙන බව වර්තමානය අධ්‍යයනය කරන විට පෙනී යයි. ඒ බව වත්මන් ලංකාවේ හා විදේශ වාණිජමය කටයුතු අධ්‍යයනය කරන විට තේරුම්ගත හැකිය. එසේ නම් එම පෞරාණික වාණිජ ක්‍රමයන් ප්‍රතිනිර්මාණය කිරීම තුළ වත්මන් ගැටලු රාශියකට පිළිතුරු සපයාගත හැකිය. එම ඓතිහාසික පරිසරය නැවත ප්‍රති නිර්මාණය කිරීම උදෙසා මෙම බදුලු ටැම් ලිපිය පාදක කරගත හැකිය. නමුත් එය පහසු කාර්යයක් නොවන වග පැහැදිලිය. මෙම පර්යේෂණ පත්‍රිකාව තුළින් මා මතුකර දක්වන්නේ මෙම ගැටලුව විසඳා ගැනීමට ඇති අභියෝග පිළිබඳව යි.

මා මෙම පර්යේෂණ පත්‍රිකාව තුළින් බලාපොරොත්තු බදුලු ටැම්පිට ලිපිය පිළිබඳව විධිමත් පර්යේෂණයක් සිදු කිරීමටයි. මෙම ලිපිය තුළින් හෙළි වන්නේ ශ්‍රී ලංකාවේ ඓතිහාසික වාණිජ කටයුතු සම්බන්ධ තොරතුරු වේ. එම ඓතිහාසික තොරතුරු ඉතා පර්යේෂණාත්මකව අධ්‍යයනය කරන විට

පෙනී යන්නේ ඒවා හුදු නොවැදගත් කරුණු ලෙස නොවේ.

**ක්‍රමවේදය**

පූර්ව පර්යේෂණ, වාර්තා ආදි පූර්ව සිදු කෙරෙන සාහිත්‍යය මූලාශ්‍රය පරිශීලනයෙන් පසුව සමාජ විද්‍යා පර්යේෂණවල දත්ත රැස් කිරීම හා විශ්ලේෂණය සඳහා යොදා ගනු ලබන නිරීක්ෂණ, සහභාගිත්ව නිරීක්ෂණය, සම්මුඛ සාකච්ඡා, කේවල අධ්‍යයන හා ප්‍රශ්නාවලි ආදි පර්යේෂණ ක්‍රමවේද යොදා ගැනීමට අපේක්ෂිතය.

**ප්‍රතිඵල සාකච්ඡාව**

හෝපිටිගමුව ගමේ හා එම වෙළඳ පොළේ පාලන කටයුතු පවත්වාගෙන යාම සඳහා පැන වූ මෙම ව්‍යවස්ථාව කොටස් හතරකින් යුක්ත වේ.

- දඩ අය කරන රාජ්‍ය නිලධාරීන් වෙළඳ සභාවේ නියෝජිතයන් හා ගමේ වැඩිහිටියන් සමග
- රාජ්‍ය නිලධාරීන් ගමේ කටයුතුවලට සම්බන්ධ විමේදී පිළිපැදිය යුතු නීතිරීති
- වාණිජ ප්‍රජාව විසින් වෙළදාම සිදු කළ යුතු ආකාරය හා ඒ පිළිබඳව රාජ්‍ය නිලධාරීන්ගේ
- ගම්වැසියන්ගේ අයිතිවාසිකම් හා යුතුකම්, පාලනය, පවත්වා ගැනීමේදී ග්‍රාමීය සංස්ථාවලට

මෙම ව්‍යවස්ථාපිත වර්ගීකරණයට අනුව ගම්බද ප්‍රදේශයක වෙළදාම හා වෙළඳ කටයුතු හා සම්බන්ධ පිරිස් කටයුතු කළ යුතු ආකාරය සඳහන්වේ. වෙළඳපොළේ රාජකාරී නියුක්ත මූලාදෑනීන් හා සේවකයන් පෙර පාලකයන් ඉදිරිපත් කළ ව්‍යවස්ථා ඉක්මවා නීති විරෝධීව තමන්ගේ අභිමතයට දඩ මුදල් හා පඬුරු ලබා ගන්නා බව පැමිණිලි කිරීමෙන් පසුව එම තත්ත්වය නැවත ඇති නොවීම සඳහා නව ව්‍යවස්ථාවක් මගින් නියෝග කර ඇත.

රටක ආර්ථිකය ශක්තිමත්ව පවත්වාගෙන යාමට නම් රාජ්‍ය භාණ්ඩාගාරය පෝෂණයට විය යුතුය. රාජ්‍ය භාණ්ඩාගාරය වර්ධනය වන්නේ රටවැසියා විසින් රජයට ලබාදෙන බදු මුදල් මගිනි. එකී ක්‍රියාවලිය සෑම විටම සාමාන්‍ය ජනතාවට හිරිහැරයක් නොවනසේ සාධාරණ විනිවිධ භාවයකින් සිදු විය යුක්තකි. විශේෂයෙන් තම රාජ්‍ය නිලධාරියා බදු අය කර ගැනීමේදී සාමාන්‍ය ජනතාවට හිරිහැර නොකළ යුතු බව සඳහන් වේ. ගම් වටලාගෙන හෝ වැසියන් ගෙවල්වල සිරකර ගෙන දඩ මුදල් අය කර ගැනීම නොකළ යුතුය. එසේම ගම්වැසියාට තර්ජනය කරමින් හෝ වෙනත් ස්ථානයකට පැහැරගෙන ගොස් හෝ බදු අය කර ගැනීම සිදු නොකළ යුතු බව සඳහන් කිරීම වැදගත් ය.

රාජ්‍ය නිලධාරීන් තමන්ගේ අභිමතය පරිදි ද්වේෂ සහගතව සිදු කරන බදු අය කිරීම පාලනය කිරීම ද විශේෂ කරුණකි. සාමාන්‍ය ජනතාව ව්‍යවස්ථාව උල්ලංඝනය කරන අවස්ථාවකදී අය විය යුතු දඩය නියම කර තිබෙන ආකාරයට ගැනීම අනිවාර්ය වේ. එය පෙර රජුන් දවස පැවති සිරිතට අනුව ලබා ගත යුතු අතර එය ද "මන්ද්‍රපණ්ඩිත්, වණිග්‍රාමන්, මහාග්‍රාම" යන නිලධාරීන්ගේ මූලිකත්වයෙන් නියම කරන ලද දඩය පමණක් නීත්‍යානුකූල වේ.

මෙම ලේඛනයෙහි අන්තර්ගත වැදගත් කරුණක් ලෙස රාජ්‍ය නිලධාරීන් කළමනාකරණය කිරීම දක්විය හැකිය. රාජ්‍ය නිලධාරියා බදු අය කිරීම සඳහා ගමට හෝ ඉඩම්වලට පැමිණි අවස්ථාවල රා, මස්, දීකිරි, ගිතෙල් ආදිය ලබා ගැනීම නොකළ යුතු බව සඳහන් වේ. බොහෝ විට ඇතැම් රාජ්‍ය නිලධාරීන්ගේ පක්ෂපාතිත්වයෙන් සිදු කෙරෙන හොර

වෙළඳාම් පාලනය කිරීම සඳහා පනවන ලද නීතියකි. විශේෂයෙන්ම ගමට හෝ වෙළඳ සභාවට පිටතින් පැමිණෙන වාණිජ ප්‍රජාවගෙන් රජයට අයවිය යුතු රට බද්ධ අය නොකළ යුතු බවත් කිසිදු අවස්ථාවක පිටතින් පැමිණෙන වෙළඳුන්ගෙන් කප්පම් ආදිය ලබා ගැනීම සිදු නොකළ යුතු බවත් දැඩිව අවධාරණය කර තිබේ.

වෙළඳපළක පැවැත්ම සඳහා සංවිධානාත්මක ප්‍රතිපත්තියක් ක්‍රියාවට නැගිය යුතුය. මේ ලක්ෂණය හෝපිටිගමු ශිලා ලේඛනයෙන් හඳුනාගත හැකිය. ඒ අනුව හොර කිරුම් මිනුම් හා වංචා සහගතව වෙළඳාම් කිරීම මෙකල තිබී ඇතැයි කිව හැකිය. ඒ අනුව ගනුදෙනු දෙපිරිසට ම අලාභයක් නොවන ආකාරයට මේ කිරුම් මිනුම් ක්‍රම සකසා තිබේ. මුද්‍රා නොතබන ලද තරාදි පඩියෙන් කිරීමට තහනම් කිරීමෙන් ඒ අදහස වඩාත් හොඳින් අනාවරණය වන්නේය.

**නොවැටු මදඩියෙන් යන්න නොවැටු - නොපැටු** යන දෙයාකාරයට ම කියවිය හැකි බවත් ''වැටු'' යන්න ගතහොත් ''වර්තිත'' යන්නට සමාන සේ ගෙන පවත්වා යන්න ද එසේ නොවේ නම් භාවිතයට බලය දී ඇති යන අදහස ගැනීමට හැකියාව ලැබෙන බවත් පරණවිතාන මහතා අදහස් දක්වයි.

වෙළෙන්දන් විසින් වෙළෙඳාමෙහි නිරත වන විට අස්ථානයෙහි එනම් උචිත නොවන ස්ථානයන්හි වෙළෙඳාම් නොකළ යුත්තන් විසින් සල්පිල් (වෙළඳාම්) නොපැවැත්විය යුතුය. ඒ අනුව සුංවත් ගතයුතු බඩු ද නුසුදුසු තැන්වල හිඳ නොවිකිණීමට දන්වා තිබීමෙන් රාජ්‍ය බදු නිසි ලෙස ලබා ගැනීමට ඇවැසි මාර්ගය සකසා ගෙන තිබු බව පෙනේ. මෙහි සඳහන් සුංවත් යන්න අයබදු ය. ඒ අනුව අය බදු ගැනීමට ඇති බඩු වෙනත් තැන්වල තබා විකිණීම ද එකල වෙළෙන්දන් විසින් කර ඇති අතර එවැනි දෑ ද තහනම් කර ඇත. තවද විකිණීමට භාවිත නොකරන බඩු නොකිරිය යුතු යයි මෙහි සඳහන් කර ඇත. ඇතැම් විට වෙළඳාමට නුසුදුසු භාණ්ඩ වෙළෙන්දන් විසින් විකිණීමට භාවිත කරන්නට ඇත. තීක්ෂණ කපටි ක්‍රම වෙළෙඳ පළෙහි දී වෙළෙන්දන් විසින් එකල ද අනුගමනය කර ඇති බව මේ අනුව පැහැදිලි වෙයි.

රාජ්‍ය සේවකයන්ට බදු ආදිය ගැනීමට පහසු වන ආකාරයට ද සාමාන්‍ය ජනයාට තම අවශ්‍යතා මත නිදහසේ බඩු බාහිරාදිය ඇතුළු සියලු දෑ තෝරා බේරා ගැනීමට ද උචිත වන ආකාරයට මේ වෙළෙඳපල සංවිධානාත්මක ව ක්‍රියාවට නංවා ඇති බව ප්‍රකාශ කළ හැකිය. එමෙන්ම සල්පිල් නොකළ යුත්තන් වශයෙන් මෙහි එන සඳහනට අනුව කිරුම් මිනුම් පිළිබඳ නිසි අවබෝධයක් නොමැති පුද්ගලයන්ට ඒවායෙහි නිරත වීම තහනම් කර ඇති බවයි. මුද්‍රා නොතබන ලද තරාදි පඩි භාවිත කරමින් වංචා සහගතව කිරුම් මිනුම් එකල වෙළෙඳුන් කර ඇති අතර රජයට ගෙවිය යුතු බදුවලින් නිදහස් වීමට අස්ථානයෙහි ද එම වෙළෙඳාම් කර ඇත.

මේ වෙළෙඳ ක්‍රමය වර්තමානයෙහි ද ක්‍රියාවට නැගෙන්නේ ය. නමුත් පොදු වැසියා පාඩු ලැබුව ද නොදන්නන් වෙළෙඳාමේ නිරත වුවද කපටි වෙළෙන්දන් තම අය පක්ෂය වර්ධනය කරගනු ලැබුව ද මේ පිළිබඳ විධිමත් වැඩ පිළිවෙලක් වර්තමානයේ ක්‍රියාවට නැගෙන බවක් දකින්නට නොලැබේ.

බුලත් පුවක් මණ්ඩපාකාරයට තබා විකිණීමට යයි කර ඇති නියෝගයෙන් ද භාණ්ඩවල ස්වරූපය අනුව ගනුදෙනු දෙපිරිසට ම පාඩු නොවන ආකාරයටත් බඩු දීමට මෙන්ම වෙළෙඳපොළ සකසා තිබූ අයුරු පැහැදිලි වෙයි. ඒ අනුව ක්‍රි.ව 10 වන සියවසෙහි ලංකාවේ

සංවිධානාත්මක මෙන්ම විධිමත් වෙළෙඳපොළක් තිබූ බව පැහැදිලි වෙයි. ඒ සඳහා රාජ්‍යයෙහි පාලක නිළධාරින් විසින් උචිත නීති රීති පද්ධතියක් සකසා වෙළෙඳ ඥානයෙන් යුත් වෙළෙඳුන් පිරිසක් මේ කාර්යයෙහි නියැළීමට ඉඩකඩ සලසා තිබීමෙන් පැහැදිලි වෙයි.

අනෙක් ලක්ෂණය වන්නේ වෙළෙඳාම වුවද නීතිමය සේවාවක් බවට පත් කර තිබීමය. ඒ අනුව පොහොය දිනයන් රජයේ නිවාඩු දිනයක් බවට පත්කර ඇති අතර ඒ දිනයන්හි වෙළෙඳාම් කිරීම ද තහනම් විය. යම් කෙනෙකු පොහොය දිනයන්හි වෙළෙඳාම් කටයුතුවල නිරත වී හසු වුවහොත් ඒ සඳහා වෙනම දඩ අය කර ඇති අතර දඩ වශයෙන් ගත් දෑ ආගමික පූජාවන් සඳහා භාවිත කර ඇත. ඇතැම් අයට ආගමික පූජාවන් පැවැත්වීමට ඒ අනුව නියම කර ඇත. මේ තොරතුරුවලට අනුව එකල ක්‍රියාත්මක කරන ලද නීති වුවද සාමාන්‍ය ජනයාගේ අභිවෘද්ධියට ම හේතුවන ආකාරයට පිළියෙළ කර ඇති බව කිව හැකිය.

මේ වෙළෙඳ පොළෙහි වෙළෙඳාම් කරන ලද වෙළෙන්දන් ඒ වෙනුවෙන් රජයට බද්දක් ද ගෙවිය යුතු විය. ඒ අනුව අය බදු ලබා ගැනීමේ දී රාජ්‍ය නිළධරයන් ද අනුගමනය කළ යුතු සිරිත් විරිත් දක්වා වෙළෙඳුන් හිංසාවට, පීඩාවට ලක් නොවන ආකාරයට අය බදු ගැනීමට අවශ්‍ය මාර්ගය සලසා ඇත. හෝපිටිගමු වෙළෙඳ නගරය ලබාගත් කිසියම් (නිළධර) කෙනෙකුගේ . සේවකයන් ගමට පැමිණි කළ උපදේශකයන්, වෙළෙඳ සංස්ථාවේ සාමාජිකයන්, ගමේ වැඩිහිටියන්, රැස්ව හිඳ සතළොස පිරිනිවියන් වහන්සේගේ කාලයෙහි (පැවති) නීති ප්‍රකාර හා පෙර පැවති සිරිත් පරිදි අය බදු ගැනීම හැර නීත්‍යනුකූල නොවන දෙයක් නොකළ යුතු විය.

ගම් ලද්දන්, සේවකයන් හා උපදේශකයන් රැස්ව විමසා තීරණය කර ගන්නා වූ සියලු අය මුදල් ලේඛන ගත කිරීම ද කළ යුතු විය. එසේ නොකර ගම් වටලා බලහත්කාරයෙන් ගෙවල්වලට ඇතුළත් වී ණය හිමියන් ගෙවල්වලට හිර කර බලහත්කාරයෙන් අය මුදල් ඉල්ලීම මේ නිළධාරීන්ට, සේවකයන්ට තහනම් වූ අතර අය මුදල් ඉල්ලීම ගමේ දී කළ යුතු විය. ගමින් බැහැරව සිටීමේ දී එවැනි දෑ කිරීමට රාජ්‍ය නිලධාරීන්ට වුවද තහනම් කටයුත්තක් විය.

එමෙන්ම ණය හිමියකු ණය දෙන තුරු යන්නට නොදී හිර කිරීම ද නොකළ යුතු විය. නියම කරන්නා වූ දඩ මුදලක් විනා ඒ සඳහා ඔහුගේ අඹු දරුවන් අල්ලා හිර කොට නොතැබිය යුතුය. එමෙන්ම ගෙවල්වලට පැමිණෙන රාජකීය නිළධාරීන්ට සේවකයන්ට ගම් වැසියන්ගෙන් රා - මස් (මුදවන ලද) කිරි, තෙල් ගැනීම තහනම් වූ අතර ගෙවල්වලට ඇතුළුව බලහත්කාරයෙන් එම ආහාරයන් ගැනීම ද රජ දරුවන්ට තහනම් විය.

### ආශ්‍රිත ග්‍රන්ථ


අභිලේඛන (1990) ***පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ශත සංවත්සරය.*** දෙවන වෙළුම. සංස්. ආචාර්ය නන්දදේව විජේසේකර. රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව.

අමරවංශ හිමි, කොත්මලේ (1969) ***ලක්දිව සෙල්ලිපි.*** ඇස්. ගොඩගේ සහෝදරයෝ. කුලරත්න මාවත. කොළඹ - 10.

ඩයස් මාලිනි. (1996) ***ශිලා ලිපි සංග්‍රහය.*** III වෙළුම. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

Paranavitana. S. (1963) ***Epigraphia Zeylanika***. Vol. V. The Archeological Department. Colombo